# ළමා හිමිකම් පිළිබඳ හැඳින්වීමක්

## ළමා හිමිකම් සුරක්ෂිත කිරීමේ සහ ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන

අධීක්ෂණ සහ සමාලෝචන අංශය
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

# ළමා හිමිකම් පිළිබඳ හැඳින්වීමක්

# ළමා හිමිකම් සුරක්ෂිත කිරීමේ සහ ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන

අධීක්ෂණ සහ සමාලෝචන අංශය
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

අනුග්‍රහය
එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (යුනිසෙෆ්)

# පටුන


ළමයා යන්න අර්ථ නිරූපනය කිරීම 03

ළමා අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තිය 04

ශ්‍රී ලංකාවේ ළමයින්ට පවතින නෛතික රැකවරණය 06

ළමයින්ට එරෙහිව සිදුවන වැරදි 13

ළමා අපයෝජනය යනු කුමක්ද ? 14

ළමයින්ට එරෙහිව සිදුවන වැරදි සම්බන්ධයෙන් සහන සැතිම 19

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පිළිබඳ හැඳින්වීමක් 24

# ළමයා අර්ථ නිරූපණය කිරීම

ශාරීරිකව සහ මානසිකව නොමේරූ අවධියක සිටීමේ හේතුවෙන් ළමයෙකුට උපතට පෙර මෙන්ම උපතින් පසුවද යෝග්‍ය නෛතික රැකවරණය ඇතුළුව විශේෂ ආරක්ෂාව සහ රැකවරණය අවශ්‍යය.
(එක්සත් ජාතීන්ගේ මහ සභා රැස්වීම,ජිනීවා -1959 නොවැම්බර් මස 20)

වයස අවුරුදු 18ට අඩු සෑම කෙනෙකුම "ළමයා" යන අර්ථ නිරූපණයට අයත් වේ.

විවිධ පනත් "ළමයා" යන්න පහත ආකාරයට අර්ථ නිරූපණය කර ඇත.

> වයස අවුරුදු 18 සම්පූර්ණ කළ තැනැත්තෙක් බාල වයස්කාර විය ඉක්මවා වයෝපූර්ණත්වයට පත් වූ වැඩිහිටියකු ලෙස සැළකේ.
> -1895 අංක 05 දරණ වයෝපූර්ණත්වය පිළිබඳ ආඥා පනත

> ළමයා යනු වයස අවුරුදු 14ට අඩු පුද්ගලයෙක් වන අතර යොවුනයා යනු වයස අවුරුදු 14-16 අතර පුද්ගලයෙකු වේ.
> -ළමයින් සහ යොවුනයින් පිළිබඳ ආඥා පනත, සාප්පු හා කාර්යාල ආඥා පනත

> ළමයෙකු යනු වයස අවුරුදු 14ට අඩු පුද්ගලයෙකු වන අතර යොවුනයා යනු වයස අවුරුදු 14 සම්පූර්ණ වූද අවුරුදු 18ට අඩු වූද පුද්ගලයෙකි.
> -කාන්තාවන්, යොවුනයින් සහ ළමයින් සේවයේ යෙදවීම පිළිබඳ ආඥා පනත

> ගැහැණු ළමයෙකු යනු වයස අවුරුදු 16ට අඩු තැනැත්තියකි.
> -අයාල ආඥා පනත

> ළදරුවෙකු යනු වයස අවුරුදු 05 නොඉක්මවූ බාල වයස්කාරයෙකි. ළමයෙකු යනු වයස අවුරුදු 05ට නොඅඩු අවුරුදු 14ට නොවැඩි බාල වයස්කාරයෙකි.
> -අධ්‍යාපන ආඥා පනත

> වයස අවුරුදු 18 සම්පූර්ණ නොකළ අයෙක් ජනාධිපති මැතිවරණ ඇතුළු සියලුම මැතිවරණ සඳහා ඡන්ද අපේක්ෂකයෙකු හා ඡන්ද දායකයෙකු වීමට නුසුදුස්සකු වේ.
> -89(ආ) වගන්තිය ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

# ළමා අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තිය

ශ්‍රී ලංකාව 1991 දී ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තියට අත්සන් තබන ලදී. ඒ අනුව වසර පහකට වරක් ළමා අයිතිවාසිකම් පිළිබඳ දේශීය තත්වය සඳහන් කරමින් ජාත්‍යන්තර ළමා හිමිකම් කමිටුවට වාර්තාවක් සැපයීමට අප රට බැඳී සිටී. එම ප්‍රඥප්තිය යටතේ හඳුන්වා දුන් ළමුන් යුද්ධයට බඳවා ගැනීමට එරෙහිව සම්මත කරන ලද වෛකල්පිත සංධානයට 2003 දී ශ්‍රී ලංකාව අත්සන් තබන ලදී.

ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තියේ සඳහන් ආකාරයට:



- ජීවත් වීමට
- වර්ධනයට
- ආරක්ෂාව ලැබීමට
- සහභාගිත්වයට

ළමයාට ඇති අයිතිය මෙලෙස ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රධාන කොටස් ලෙස හැඳින්විය හැකිය.

ජීවත් වීමට ඇති අයිතිය

- සෑම ළමයෙකුටම ජීවත්වීමට අයිතියක් ඇති අතර ළමයාගේ ජීවිතයට එල්ල වන සියලු අනතුරු එනම් යුද්ධය, ස්වාභාවික විපත්, එච්.අයි.වී. (ඒඩ්ස්), මන්දපෝෂණය, අනතුරුදායක රැකියා සූරාකෑම් වලින් ළමයාගේ ජීවිතය ආරක්ෂා කිරීමට රාජ්‍යයන් බැඳී සිටිය (ව්‍යවස්ථාව 6).
- මීට අමතරව සෑම ළමයෙකුටම අනන්‍යතාවයක් ලබාදීමට රාජ්‍යයන් බැඳී සිටී (ව්‍යවස්ථාව 7).

වර්ධනයට ඇති අයිතිය

- දරුවන් හදා වඩා ගැනීමට දෙමව්පියන්ට වගකීමක් ඇත. (ව්‍යවස්ථාව 18).
- ළමයාට ප්‍රමාණවත් සෞඛ්‍ය හා වෛද්‍ය පහසුකම් ලබා දීමට රාජ්‍ය බැඳී සිටීම (ව්‍යවස්ථාව 24).
- ළමයා ජීවත් වන සමාජයෙන් එල්ල වන තර්ජනයන්ගෙන් ළමයාව ආරක්ෂා කිරීමේ වගකීම (ව්‍යවස්ථාව 26).
- ළමයාට ප්‍රමාණවත් ජීවන මට්ටමක් ලැබීමට ඇති අයිතිය (ව්‍යවස්ථාව 27).
- කිසිදු වෙනස්කමකට භාජනය නොවීමට, අධ්‍යාපනය ලැබීමට සෑම ළමයකුටම අයිතියක් ඇත (ව්‍යවස්ථාව 28).
- සෑම ළමයෙකුටම තමන්ගේ සංස්කෘතික ආගමික හා භාෂා අයිතිය ලැබිය යුතුයි (ව්‍යවස්ථාව 30).

ආරක්ෂාව ලැබීමට ඇති අයිතිය

- ළමයා සියලු ආකාරයේ ශාරීරික හා මානසික අතවර වලින් ආරක්ෂා වීමට ඇති අයිතිය (ව්‍යවස්ථාව 19).
- ළමයාට සියලු ආකාරයේ නීති විරෝධී මත්ද්‍රව්‍ය භාවිතයෙන් වැළකීමට ඇති අයිතිය. (ව්‍යවස්ථාව 33).
- ළමයාට එරෙහි සියලු ආකාරයේ ලිංගික අතවර වලින් ආරක්ෂා වීමට අයිතියක් ඇත. (ව්‍යවස්ථාව 34).
- නීති විරෝධී ළමා වෙළඳාම සහ ප්‍රවාහනයන් වලින් ආරක්ෂා වීමට ළමයාට ඇති අයිතිය. (ව්‍යවස්ථාව 35).
- කෲර වධහිංසා වලින් සහ දඬුවම් වලට ලක් නොවීමේ අයිතිය (ව්‍යවස්ථාව 37).
- ළමයින් සම්බන්ධ වන සියලු ආකාරයේ යුධ ගැටුම් වලදී ජාත්‍යන්තර මානුෂීය නීතීන් යටතේ වන ඊනින්ගි ආරක්ෂාව ලැබීමට ළමයින්ට ඇති අයිතිය. (ව්‍යවස්ථාව 40).

සහභාගීත්වයට ඇති අයිතිය

- වර්ධනයට අවශ්‍ය මාර්ගෝපදේශයන් ලබා ගැනීමට ඇති අයිතිය (ව්‍යවස්ථාව 5).
- නිදහසේ ළමයාට අදහස් ප්‍රකාශ කිරීමට ඇති අයිතිය (ව්‍යවස්ථාව 12).
- සියළු මාධ්‍යයන්ගෙන්, එනම් වාචික සහ මුද්‍රිත මාධ්‍යයන් ගෙන් තොරතුරු ලබා ගැනීමට ළමයාට ඇති අයිතිය (ව්‍යවස්ථාව 13).

- සිතීමේ හෘදය සාක්ෂියේ සහ ආගමික නිදහසට ළමයාට ඇති අයිතිය (ව්‍යවස්ථාව 14).
- සමාගමයේ සහ නිදහසේ එක් රැස් වීමට ළමයාට ඇති අයිතිය (ව්‍යවස්ථාව 15).

මෙම අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේදී, අවශ්‍ය වන නීති රීති සැකසීම සහ පහසුකම් සැපයීමට රජයට ප්‍රධාන වගකීමක් ඇත.

ඉහත කී ළමා අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තිය ආශ්‍රයෙන් දේශිය වශයෙන් ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තියක් සකස් කර ඇතත ශ්‍රී ලංකා ළමා ප්‍රඥප්තිය දැනට නීතිය ඉදිරියේ බලාත්මක කළ හැකි ලියවිල්ලක් නොවේ.

## ශ්‍රී ලංකාවේ ළමයින්ට පවතින නෛතික රැකවරණය

ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන ළමයින් සම්බන්ධයෙන් වන නීති :-

- ළමා ශ්‍රමිකයින් සම්බන්ධ නීති :-කාර්යාල සහ සාප්පු සේවකයින්ගේ පනත
- බාල අපරාධකරුවන් සම්බන්ධ නීති :- දණ්ඩ නීති සංග්‍රහය
- ළමයින් සම්බන්ධ පවුල් නීතිය යටතේ ක්‍රියාත්මක වන නීති
- සිවිල් සහ අපරාධ කාර්යය පටිපාටිය යටතේ ළමයින් සම්බන්ධ නීති රෙගුලාසි :-සිවිල් කාර්යය පටිපාටිය

## ළමයින්ට අදාළ වන ව්‍යවස්ථා සහ පනත්

### 1998 අංක 50 දරණ ජාතික ළමා ආරක්ෂක අධිකාරී පනත

මෙම පනත මගින් ළමා අපයෝජනය වැලැක්වීම හා එගේ අපයෝජනයට ලක්වූ යම් දරුවෙකුගේ ආරක්ෂාව හා ප්‍රතිකාර කිරීම ආදි සියලු ආකාරයේ ළමා අපයෝජනයන් වැලැක්වීම හා ඊට විරුද්ධව ක්‍රියා කිරීම සහ ඒ සම්බන්ධ අරමුණු ඉලක්ක කොට ගත් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

නම් ආයතනය, පිහිටුවා ඇත. මෙම අධිකාරියේ සාමාජිකයන්, බලතල, අධිකාරියේ රැස්වීම්, නිලධාරී මණ්ඩලය, විෂය භාර අමාත්‍යවරයාට උපදෙස් දීමට ඇති බලතල හා ළමයින්ට අදාළ ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කරවා ගැනීමට ඇති බලතල ආදියට අදාළ නීති තත්ත්වය අඩංගුය.

1939 අංක 48 දරණ ළමා හා යෞවන ආඥා පනත හා එහි සංශෝධන

මෙම පනත ළමා අධිකරණ පිහිටුවීම හා ළමා අපරාධකරුවන් අධීක්ෂණය, යෞවනයන් හා ළමයින් ආරක්ෂා කිරීම හා ඒ හා සම්බන්ධ අනෙකුත් කාර්යයන් සඳහා පනවන ලද්දකි. ළමා අධිකරණ වලට අදාළ වන කාර්ය පටිපාටිය, යෞවන වරදකරුවන් හා ළමා වරදකරුවන් සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී එකී අධිකරණ කටයුතු කරන මූලික ප්‍රතිපත්ති මෙහි අඩංගු වේ.

1927 අංක 4 දරණ අසභ්‍ය ප්‍රකාශන ආඥා පනත

ළමුන් හා යෞවනයන් සම්බන්ධව ඔවුන්ගේ යහපැවැත්මට බාධා කරමින් කරනු ලබන අසභ්‍ය ප්‍රකාශන වැළැක්වීමේ අරමුණින් පනවන ලද පනතකි. කවර ප්‍රකාශන සඳහා පනත අදාළ වන්නේද, එය අපරාධමය වරදක් වන අවස්ථා හා එවන් ප්‍රකාශන ආනයනය කිරීම තහනම් කිරීමේ ප්‍රතිපාදන මෙහි දක්වා ඇත.

1944 අංක 42 දරණ වරදකරුවන් පරිවාස ගත කිරීම පිළිබඳ ආඥා පනත හා සංශෝධන

වරදකරුවන් පරිවාසගත කිරීම මත නිදහස් කිරීම, එවැනි පරිවාසගත කරන්නවුන් අධීක්ෂණය කිරීම හා පරිවාස සේවාවේ පරිපාලන ව්‍යුහය සැකසීම උදෙසා පනවන ලද පනතකි. මෙහි පරිවාස ගත කරන අවස්ථා, පරිවාස කොන්දේසි, පරිවාසය යටතේ නිදහස් වීම, ඇප ලබා දීම, අධීක්ෂණය හා පරිවාස කොමසාරිස් ප්‍රමුඛ පරිවාස සේවාව සම්බන්ධ නීති තත්වයද ඇතුලත්ය.

1939 අංක 28 දරණ යෞවන වරදකරුවන් (පුහුණු පාසල්) පිළිබඳ ආඥා පනත හා එහි සංශෝධන

යෞවන වරදකරුවන් රඳවා තබා ගැනීම, පුහුණු කිරීම හා ඔවුන් පුනරුත්ථාපනය කිරීමේ අරමුණින් හා ඒ හා සම්බන්ධ ක්‍රියාමාර්ග වලට පිහිටුවන ලද පනතකි. මෙහි පුහුණු පාසල් වල ආයතනික ව්‍යුහය,

වරදකරුවන්ට පුහුණුව අනිවාර්ය කරන කොන්දේසි, ඔවුන් අධීක්ෂණය කිරීම හා එක් පුහුණු පාසලක සිට තවත් පුහුණු පාසලකට මාරු කිරීමට අදාළ නීති තත්වයන් අන්තර්ගතව ඇත.

1841 අංක 04 දරණ පාදඩ (අයාල) ආඥා පනත

අයාලේ යාම යන වරද සම්බන්ධ නීති තත්වය මෙහි ඇත. අයාලේ යාම යන වරද සංයුක්ත කරන අවස්ථා, හැසිරීම්, එම වරදට අදාළ දඬුවම. මහේස්ත්‍රාත්ට මේ සම්බන්ධව ඇති බලතල, අයාලේ යන්නවුන් පරිවාස ගත කිරීම හා ඇප ලබා ගැනීම. සම්බන්ධව නීති ඇතුළත්ය.

1907 අංක 05 දරණ රැඳවුම් නිවාස පනත

අයාලේ යන්නවුන් වරදකරු කළ පසු රඳවා තබා ගැනීම සඳහා රැඳවුම් නිවාස පිහිටුවීමට අදාළ පනතයි. මේ සඳහා විෂයභාර අමාත්‍යවරයාට ඇති බලතල, මහේස්ත්‍රාත් බලතල හා රැඳවුම් ආඥා නිකුත් කිරීමේ ඉඩකඩ / අවස්ථා, රැඳවුම් නිවාස වලින් පැනයාම හා එයට දඬුවම ආදිය ඇතුළත් වේ.

1895 අංක 17 දරණ සාක්ෂි ආඥා පනත

මෙය නඩු විභාග වලදී සාක්ෂිදීම සම්බන්ධ නීති තත්වය පැහැදිලි කරන ආඥා පනතකි. අනුකූල සාක්ෂි, ලිඛිත/වාචික සාක්ෂි, ඔප්පු කිරීම, පිළිගැනීම් හා පාපොච්චාරණ, සාක්ෂිකරුවන් ලෙස කැඳවිය නොහැකි පුද්ගලයන්ගේ ප්‍රකාශ, විශේෂ අවස්ථා යටතේ කරනු ලබන ප්‍රකාශ හා ඒවා ඔප්පු කිරීම, විශේෂ සාක්ෂි ඔප්පු කිරීමේ භාරය ඇතුළු සාක්ෂි නීති තත්වයන් අඩංගු වේ.

1889 අංක 2 දරණ සිවිල් නඩු විධාන සංග්‍රහය

මෙහි සිවිල් නඩු කාර්ය පටිපාටිය දීර්ඝ වශයෙන් පැහැදිලි කෙරේ. සිවිල් නඩු නිමිත්ත, නිවැරදි අධිකරණය තෝරා ගැනීම, අධිකරණ බලය, පැමිණිලි ගොනු කිරීම, සිතාසි, සාක්ෂිදීම, නඩු විභාග, අතුරු නියෝග, අභියාචනා දැන්වීම් හා අභියාචනා බලතල ඇතුළු සියලු නඩුකාර්ය පටිපාටින් ඇතුළත්ය.

1883 අංක 12 දරණ දණ්ඩ නීති සංග්‍රහයේ (1995 අංක 22 දරණ හා 1998 අංක 29 දරණ සංශෝධිත)

දණ්ඩ නීති සංග්‍රහය අපරාධමය වරදවල් පෙළ ගස්වා ඇති ලිඛිත ලියවිල්ලයි. වගන්ති රැසක් පුරා දේපල හා පුද්ගලයන්ට එරෙහිව ඇති වරදවල් දක්වා ඇත. එහි සංශෝධන මගින් ළමයින් සම්බන්ධ ලිංගික අපරාධමය අවස්ථා හඳුන්වා දුන් අතර, ස්ත්‍රී දූෂණය සම්බන්ධ නීති තත්වය සංශෝධනය කරන ලදී.

1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහ පනත (1995 අංක 20, 1997 අංක 19, 1998 අංක 28 දරණ සංශෝධිත)

අපරාධමය වරදක් සිදුකරන ලද පුද්ගලයෙකු සම්බන්ධව අධිකරණ කාර්යපටිපාටිය මෙහි ඇතුළත්ය. අත් අඩංගුවට ගැනීම, පොලිස් විමර්ශනය, නඩු ගොනු කිරීම, සාක්ෂි, ඇප ලබා ගැනීමේ අවස්ථා, මහේස්ත්‍රාත් පොලිස් විමර්ශනයට සහය වීම, වරෙන්තු, තීන්දු ප්‍රකාශ හා අභියාචනා කිරීමේ බලතල ආදිය මෙහි අඩංගු නීති තත්වයන්ය.

1999 අංක 37 දරණ නඩත්තු (සංශෝධිත) පනත

කලත්‍රයා විසින් දරු පවුල නඩත්තු කිරීම පිළිබඳ නීති තත්වය පැහැදිලි කෙරෙන පනතකි. විවාහය ඔප්පු කිරීම, ආදායම් සහතික, පිතෘත්ව තත්වය පිළිගත් හෝ නොගත්විට නීති තත්වය, අතුරු දීමනා ලබා දීමට මහේස්ත්‍රාත්ට ඇති බලතල විවාහය හා ස්ථිර දීමනාව නියෝග කිරීමට අදාළ නීති තත්වය දක්වා ඇත. නඩත්තු දීමනාව නොගෙවා සිටි විට වගඋත්තරකරුට එරෙහිව ඇති දඬුවම්ද මෙහි දක්වා ඇත.

1865 අංක 07 දරණ වයෝපූර්ණත්ව ආඥාපනත

ශ්‍රී ලංකාව තුළ වයෝපූර්ණත්ව වයස් සීමාව අවු:21 බවට වන නීතිය අඩංගුය. මෙය 1987 සංශෝධනයෙන් අවු: 18 දක්වා අඩු කර ඇත.

1951 අංක 17 දරණ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ ආඥාපනත

දරු උපත් හා මරණ ලියාපදිංචි කිරීම සඳහා වූ ආඥා පනතකි. පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල්, දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා හා ඔවුන්ගේ බලතල, ඔවුන්ගේ රාජකාරි, උපතක් ලියාපදිංචි කරන ක්‍රියා පිළිවෙල, මරණ ලියාපදිංචි කරන කාර්ය පටිපාටිය හා මරණයක් ඉවත් කිරීමේ සාවද්‍යතු කිරීමේ යම් විශේෂ විධිවිධාන මෙහි අඩංගු වේ.

1907 අංක 19 දරණ සාමාන්‍ය විවාහ ආඥා පනත (1995 අංක 18 දරණ හා 1997 අංක 12 දරණ සංශෝධනය)

මුස්ලිම් විවාහ හැර වෙනත් විවාහ ලියාපදිංචි කිරීම සඳහා වූ පනතකි. මෙහි විවාහ රෙජිස්ට්‍රාර්, නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් යන නිලධාරීන්ගේ කාර්යභාරය ඔවුන්ගේ පත්වීම, විවාහ දැන්වීම් ප්‍රකාශයට පත්කිරීම, අඩුම වයස, නීතියේ අවසරය නැති ඥාතීන් සමඟ විවාහ තහනම් කිරීම, විවාහ සහතික බලපත්‍ර නිකුත් කිරීම හා නීත්‍යානුකූල නොවන හා පනතට අනුකූල නොවන විවාහයකදී දඬුවම් ආදී නීති තත්ත්වයන් ඇතුළත්ය.

1952 අංක 44 දරණ උඩරට විවාහ දික්කසාද ආඥාපනත
(1995 අංක 19 දරණ සංශෝධනය)

මෙහි උඩරට නීතිය යටතට වැටෙන පුද්ගලයන්ගේ විවාහය හා සම්බන්ධ කටයුතු වලදී අදාළ වන නීතිය, උඩරට විවාහයක වලංගු බව, දරුවන් නීත්‍යානුකූල කිරීම, විවාහය සඳහා වන කැමැත්ත යන අවශ්‍යතාවය. එවන් විවාහ ලියාපදිංචි කිරීම හා ක්‍රියාපටිපාටිය අඩංගු වේ. මේ හා සමානව උඩරට විවාහයක දික්කසාදයට අදාළ නීති තත්ත්වයද පැහැදිලි කෙරේ.

1939 අංක 31 දරණ අධ්‍යාපන ආඥාපනත හා ඒ යටතේ පනවා ඇති රෙගුලාසි

විධිමත් අධ්‍යාපනය උදෙසා විධිවිධාන අඩංගු ආඥා පනතකි. මධ්‍යම අධිකාරිය යටතේ වන අධ්‍යාපන දෙපාර්තමේන්තුව පිළිබඳවත් උපදේශක මණ්ඩල, ග්‍රාමීය හා නාගරික අධ්‍යාපන බලධාරීන් සතු බලතල, ව්‍යවස්ථාව හා එවායේ රාජකාරි, පාසැල් වල ආගම් හා කළමණාකරුවන්, ඇමතිතුමාට රෙගුලාසි පැනවීමට ඇති බලතල හා රජයේ පාසැල් සම්බන්ධව නීති තත්ත්වයක් අන්තර්ගත වේ.

1948 අංක 20 දරණ ආගමන හා විගමන ආඥාපනත හා එහි සංශෝධන

මෙම ආඥා පනත පිටතින් ලංකාවට පැමිණෙන පුද්ගලයන් පාලනය කිරීම, ලංකා පුරවැසියන් නොවන පුද්ගලයින් රටින් පිටවීම සම්බන්ධව නීති රෙගුලාසි පැනවීම, රටට අභිලාෂ නොවන පුද්ගලයන් රටින් ඉවත් කිරීම හා ඒ හා සම්බන්ධ කටයුතු නීති තත්ත්වයන් ඇතුළත් ආඥා පනතකි. මේවා සඳහා වන පරිපාලනමය සැකසීම්, ඒ සඳහා පිහිටුවා ඇති ආයතනික ව්‍යුහයන් මෙහි දක්වා ඇත.

1979 අංක 38 දරණ පනතින් සංශෝධිත කුලවැද්දා ගැනීමේ ආඥා පනත (1992 අංක 15 දරණ සංශෝධිත)

දරුවන් කුලවැද්දා ගැනීමට අදාළ නීතිය, ස්වභාවික දෙමාපියන් නොවන නමුත් දරුවාගේ ආරක්ෂාව භාරය හෝ පාලනය භාරව සිටින පුද්ගලයින් ලියාපදිංචි කිරීමට හා ඒ සම්බන්ධ කරුණු වලට අදාළ නීති තත්ත්වය හඳුන්වා දුන් ආඥා පනතකි. මෙහිදී අධිකරණය කුලවැද්දා ගැනීමකට ඉඩ දෙන්නේ කවර අවස්ථාවකදීද යන්නට විශේෂ ප්‍රතිපාදන දක්වා ඇත.

අධිකරණ සංවිධාන පනත

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 105 (1) වගන්තියට අනුව අධිකරණ පිහිටුවීම සඳහා වන ප්‍රතිපාදන අඩංගු පනතකි. මෙහි අධිකරණ හා ඒවායේ බලසීමා, ශ්‍රී ලංකා ජනරජයේ මහාධිකරණ පද්ධතිය දිසා අධිකරණ, මහේස්ත්‍රාත් අධිකරණ ප්‍රාථමික අධිකරණ හා පොදුවේ අධිකරණ පද්ධතියට අදාල වන නීති අඩංගු වේ.

1956 අංක 47 දරණ කාන්තාවන්, යොවුනයන් හා ළමයින් සේවයේ යෙදවීමේ පනත හා ඒ යටතේ පනවා ඇති රෙගුලාසි

මෙම පනතේ කාන්තාවන් යොවුනයන් හා ළමා පිරිස් සේවයේ යෙදවීමේදී බලපාන නීති තත්ත්වය අඩංගුය. කර්මාන්ත ආශ්‍රිතව කෙරෙනු ලබන රාත්‍රී සේවය, මුහුද ආශ්‍රිතව සේවයේ යෙදවීම්, හා පොදුවේ වෙනත් ශ්‍රම කාර්යයන් වල යෙදවීමේදී බලපාන නීති සංකල්පන් දක්වා ඇත. රාත්‍රී සේවය සඳහා වන සීමාවන්, එකී සීමා අදාල නොවන අවස්ථා සහ ආධුනිකයන්ගේ හා පුහුණු වන්නන්ගේ රාත්‍රී සේවා මුර අතරතුර කෙටි නිවාඩු ආදී, සියලු නීතින්ද, ඉහත පිරිස් සම්බන්ධව ලියාපදිංචි ලේඛන පවත්වා ගැනීමේ අවශ්‍යතාවයද දක්වා ඇත.

1979 අංක 41 දරණ බීමත්කම යටතේ සිදුකරන වැරදි පිළිබඳ ආඥාපනත

මෙම ආඥා පනත බීමත්කම යටතේ සිදුකරන ලද නිශ්චිත වැරදි සම්බන්ධව වන දඬුවම් ඉහළ දැමීම සඳහා පනවන ලද්දකි. බීමත්කම යටතේ අන් අයට කරනු ලබන හිරිහැර, මහජන දේපළ හානි, වයස අවුරුදු 12 අඩු දරුවන් බීමත්කරවීම, අවුරුදු 18 අඩු ළමයින්ට මත්ද්‍රව්‍ය විකිණීම, හා තවත් වැරදි වන අතර ඒවාට අදාල දඬුවම් ද අධිකරණ බලය සම්බන්ධව ද නීති අඩංගුය.

## 1941 අංක 22 දරණ අනාථ නිවාස ආඥාපනත

මෙම ආඥා පනත අත්හැර දමන ලද දරුවන් හා අනාථ දරුවන්ගේ නඩත්තුවට, ආරක්ෂාවට හා නවාතැන් උදෙසා රඳවා තබන ස්ථාන හා අනාථ නිවාස පාලනය හා ලියාපදිංචිය සඳහා වුවකි. මෙහි අනාථ නිවාස ලියාපදිංචිය, අනාථ නිවාස සම්බන්ධව සිටින රෙජිස්ට්‍රාර්වරයා, ලියාපදිංචිය සඳහා ඉල්ලුම්පත්, අනාථ නිවාස පරීක්ෂකවරු, ලියාපදිංචි සහතික, අමුත්තන්, ලියාපදිංචි සහතික අවලංගු කිරීම හා පොදුවේ ළමා නිවාස වලට අදාළ නීති තත්ත්වයන් ද දක්වා ඇත.

## ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

12 (4) කාන්තාවන්ගේ, ළමයින්ගේ හෝ අබල තැනැත්තන්ගේ ප්‍රගතිය සඳහා නීතියෙන් හෝ අනුනීති වලින් හෝ විධායක ක්‍රියා මාර්ගයෙන් හෝ විශේෂ විධිවිධාන සැලැස්වීම මේ ව්‍යවස්ථාවෙන් කිසිසේත් අවහිර නොවන්නේය.
27 (13) ළමයින් සහ යෞවනයන් කායික වශයෙන්, මානසික වශයෙන්, සදාචාරාත්මක වශයෙන්, ආගමික වශයෙන් හා සාමාජික වශයෙන් පූර්ණ වර්ධනයට පත්වන බවට වගබලා ගැනීමටත්, ඔවුන් ආත්මාර්ථය පිණිස යොදා ගනු ලැබීමෙන් සහ වෙනස්කම් වලට පාත්‍ර කරනු ලැබීමෙන් ආරක්ෂා කර ගැනීමටත් හැකි වන පරිදි ඔවුන්ගේ සුභ සිද්ධිය රජය විසින් විශේෂ පරිශ්‍රමයකින් යුතුව වර්ධනය කළ යුත්තේ ය.

# ළමයින්ට එරෙහිව සිදුවන වැරදි

**ළමයින් සේවයේ යෙදවීම**


අවුරුදු 14ට අඩු ළමයින් සේවයේ යෙදවීම නීති විරෝධී වේ.
සාප්පු හා කාර්යාල සේවකයන්ගේ ආඥා පනත

**ලිංගික අපචාර**

ළඟම ඥාතීන්ගෙන් හෝ තුන්වන පාර්ශවයන් ගෙන් තම නිවසෙහිදී, පාසැල්, ක්‍රීඩා ස්ථාන, ළමයින් රැකබලා ගන්නා ස්ථාන, පොලිසිය යන ස්ථාන වලදී ළමුන් ලිංගික අපචාර වලට ලක් විය හැක.

**ළමා සොල්දුවන්**

එල් ටී ටී ඊ සංවිධානය මගින් සහ වෙනත් නීති විරෝධී සංවිධාන මගින් ළමයින් සොල්දාදුවන් ලෙස යුධ කටයුතු වලදී යොදවා ගැනීම.



**ළමා අපරාධකරුවන්**


නීති විරෝධී ක්‍රියාවන් සහ මත්ද්‍රව්‍ය ජාවාරම සඳහා ළමයින් යොදවා ගැනීම
1998 අංක 29 දරණ දණ්ඩ නීති සංග්‍රහ (සංශෝධන) පනත

**ළමා සිරකරුවන්**

ළමයින් ගේ ආරක්ෂාව ගැන කිසිදු ක්‍රියාමාර්ගයක් නොගෙන වැඩිහිටි අපරාධකරුවන් සමග බන්ධනාගාර වල රැඳවීම. එමෙන්ම දින නියමයක් නොමැතිව ළමා නිවාසවල සහතික පාසැල් හා පුනරුත්ථාපන කඳවුරු වල සිටීම.

# ළමා අපයෝජනය යනු කුමක්ද?

ළමයාගේ ආරක්ෂාව සහ යහපැවැත්ම පිළිබඳව ක්‍රියාකිරීමේදී ළමා අපයෝජනය යනු කුමක්ද යන්න පිළිබඳව සහ එය සිදුවිය හැකි ආකාරයන් පිළිබඳව නිවැරදි අවබෝධයක් ලබා ගැනීම වැදගත්ය.




ශාරීරිකව අපයෝජනයට ලක් වීම

ළමයෙකුට ශාරීරික හානියක් ඇතිකරන හෝ ඇතිවිය හැකි ආකාරයෙන් වැඩිහිටියකු විසින් හෝ සම වයසේ පසුවන ශක්තිමත් ළමයෙකු විසින් හිතාමතාම හෝ අත්වැරදීමක් නොවන ක්‍රියාවක් මගින් සිදුකරන හානියක් ශාරීරික අපයෝජනයක් වශයෙන් සැලකිය හැකිය.

ශාරීරික අපයෝජනයට භාජනය වූ ළමයකු හඳුනා ගත හැකි ලක්ෂණ

භෞතික ලක්ෂණ

- තුවාල, තැලීම්, ඉලිප්පීම්, කැපීම්, පිළිස්සීම්, හැපීම් වල ලකුණු සහ සැතයන්
- විවිධ අවස්ථා වල සුව වෙමින් පවතින තුවාල
- කාලාන්තරයක් තිස්සේ නොකඩවා සිදුවී ඇති තුවාල
- ගාංචු දැමීමෙන් යකඩ දන්වැල් භාවිතයෙන් සහ දුම්වැටි වලින් පිළිස්සීම ආදිය මගින් සිදු කර ඇති තුවාල
- බාල වයසේ පසුවන (පෙර පාසැල් ) ළදරුවන්ගේ මුහුණෙහි දැකිය හැකි තුවාල
- ළමයාගේ වයස සහ වර්ධනය හා නොගැලපෙන ආකාරයේ තුවාල
- ළමයාගේ හිසේ තැනින් තැන හිසකෙස් ගැලවීම නිසා ඇතිවී ඇති කැළැල්

- ළමයා දැඩින් දිගටම හදිසි අනතුරු වලට මුහුණ දීම සහ විෂවීම් වලට ලක් වීම.

හැසිරීම තුළින් දැකිය හැකි ලක්ෂණ

- පැන යාමේ උත්සාහයන් සහ නිවසට යාමට ඇති බිය.
- රළු කථා විලාසයන් දැඩ් අයාගෙන නිසොල්මනේ සිටීම හෝ ගල් ගැසුණු ආකාරයෙන් නොසෙල්වී සිටීම, රිදවීමක් කළ විට ඉන් මිදීමට උත්සාහ නොගැනීම.
- තමා වරදකරුවෙකු බව සහ තමාට දඬුවම් ලැබිය යුතු බව ප්‍රකාශ කිරීම
- තුවාල සිදුවූ ආකාරය අනාවරණය කිරීමට නොහැකි වීම හෝ එකිනෙක නොගැලපෙන විස්තර ඉදිරිපත් කිරීම.
- වැඩිහිටියන් කෙරෙහි සැකයෙන් යුතුව බැලීම සහ නිවසට ඇති නොකැමැත්ත.
- පාසැලට හෝ පංතියට බොහෝ අවස්ථා වල නොපැමිණීම
- බලාපොරොත්තු රහිත ස්පර්ශයකදී තිගැස්සීම හෝ පැකිළීම
- අධික සලකාකාරීත්වය.
- අවිචාරවත් ලෙස හැසිරීම සහ භාෂාව හැසිරවීම.
- නින්දේදී පෙන්වන අස්වාභාවික ස්වරූපයන් අඳුරට දක්වන බිය සහ නිතර නිතර නින්දෙන් බිය වීම.
- මත් ද්‍රව්‍ය ගැනීමට යොමු වීම.
- දුර්වල මතක ශක්තිය සහ සිතේ එකඟතාවය
- සිය දිවි නසා ගැනීමට උත්සාහ කිරීම.

ලිංගිකව අපයෝජනයට ලක් වීම

ලිංගික අපයෝජනය වශයෙන් සාමාන්‍යයෙන් සලකන්නේ වැඩිහිටියකු හෝ සම වයසේ පසුවන සැලකියයුතු තරමේ ශක්තිවන්තයෙකු විසින් ළමයෙකු ඕනෑම ආකාරයක ලිංගික ක්‍රියාවකට යොදා ගැනීමයි. ළමයින් සහ යොවනයන් අතරේ සිදුවන ලිංගික ක්‍රියාකාරකමකදී වැඩිහිටි හෝ ශක්තියෙන් වැඩි ළමයා (යොවනයා) බාලවයස්කරුවා හෝ දුර්වලයා ගෙන් ලිංගික විලප්‍රයෝජනයක් ලබාගන්නේ නම් එවැන්නකින් ලිංගික අපයෝජනයක් සිදුවේ.

ලිංගික අපයෝජනයට ලක් වූ ළමයකු තුළින් දැකිය හැකි ලක්ෂණ

ශාරීරික

- නින්ද නොයාම සහ ඒ හේතුවෙන් ඇතිවන අධික තෙහෙට්ටුව
- ශරීරයේ බර පාළුකියේ වෙනස් වීම

- තමා විසින්ම ඉදෙපැත්වල සහ ශරීරයේ සිදුකරගනු ලබන තුවාල සහ කැපීම්.
- නිතර නිතර අසනීප වීම.
- නිඳ ගැනීමට හෝ ඇවිදීමට ඇති අපහසුව.
- ආසාදනයක් හේතුවෙන් ජනනේන්ද්‍රියන් අසාමාන්‍ය ලෙස කැසීම
- ඉරුණු පැල්ලම් ගැසුනු හෝ රුධිරය තැවරුණු ඇඳුම් (යට ඇඳුම්)
- ලිංගාශ්‍රිත රෝගාබාධ.
- ගැහැණු ළමයකු නම් ගර්භණීභාවය.

හැසිරීම තුළින් දැකිය හැකි ලක්ෂණ

- නිතර නෑඩීම දුකෙන් හෝ සාංකාවෙන් කල් ගත කිරීම
- ඛාධගින්න රුචිය අඩු වීම හෝ වෙනස් වීම.
- සාමාන්‍ය එදිනෙදා ක්‍රියාකාරකම් පිළිබඳ උනන්දුව හදිසියේ අඩු වීම.
- අපහසුවෙන් (ක්‍ෂුද්‍ර දරුවෙකු සේ) කථා කිරීමට උත්සාහ කිරීම.
- වයසට නොගැළපෙන ලිංගික ක්‍රියාකාරකම්ල රූප ඇඳීම හෝ එස්තර ඉදිරිපත් කිරීමට පෙළඹීම.
- යම් යම් ස්ථානයන්ට සහ මිනිසුන්ට දක්වන බිය.
- සිය දිවි හානි කර ගැනීමට උත්සාහ කිරීම.
- මද්‍යසාර භාවිතය.
- හේතුවක් දැක්වීම අපහසු ආකාරයේ රෝගාබාධ, වේදනා, හිසේ කැක්කුම් ඇතිවීම.

මානසිකව අපයෝජනයට ලක් වීම

ළමයෙකු මානසිකව අපයෝජනය විය හැකිය පුරුද්දක් වශයෙන් ළමයකු අවමානයට නින්දාවට පාත්‍ර කිරීම මගින්, ජීවත පැවැත්මට අත්‍යවශ්‍ය පෝෂණය ලබා නොදීම් නිසා මානසිකව අපයෝජනය විය හැකිය.

තමන්ට සිදුවූ අපයෝජනයන් පිළිබඳව ළමයකු ඔබට හෙළිදරව් කළේ නම්-

- අපයෝජනයකට හෝ නොසලකා හැරීමකට ලක්වූ දරුවකුට අවශ්‍යවන්නේ විශ්වාසවන්ත යහ ඔහුගේ ප්‍රශ්න පැවසිය හැකි ආකාරයේ පුද්ගලයෙකි. අපරාධයේ ප්‍රතිවිපාකයන් වශයෙන් දරුවා බියට පත්වන අතර එමගින් ඔවුන් බොහෝ සෙයින් සිත් තැවුලට හා ලැජ්ජාවට පත්වේ. ඔබ ඔවුන් වෙත දක්වන සත්පුන් ප්‍රතිචාරය අනුව, ඔවුන්ට සිදුවූ අපරාධය/අපයෝජනය පිළිබඳව හරුණු නොවලහා හෙළිකිරීමට ඉදිරිපත් වෙති.

- අපයෝජනයට ලක් වූ ළමයෙකු ඔබට කරුණු ඉදිරිපත් කිරීමේදී, ඒවා ප්‍රමාණවත් නොවේ යැයි හෝ විශ්වාස කළ නොහැකි යැයි ඔබට සිතීම සාමාන්‍ය දෙයක් වුවත් එසේ සිතීම මගින් ඔබ අවිචාරවත් ලෙස ක්ෂණික තීරණයන්ට එළඹීමට පෙළඹිය හැකිය. කරුණාකර ඔබට සිදුවූ දෙය පිළිබඳව තවත් යමක් කියව පුළුවන්ද? වැනි සාමාන්‍ය ප්‍රශ්න ඇසිය යුතු. අතර කිසිදු විටක අදාළ සිද්ධියට හේතු වූ කරුණු සෙවීමේ අරමුණින් "ඇයි ඔයා එයාට ගැහුවේ ? ", වැනි ප්‍රශ්නාර්ථයක් සහිත ප්‍රශ්න නොඇසිය යුතුය. එවැනි ප්‍රශ්න තුළින් ළමයාට තමා වරදකරුවෙකු බව හැඟියන අතර ප්‍රශ්නය පිළිබඳව ඔබ සමග සාකච්ඡා කිරීමට ඔහු පැකිළිය හැකිය.

- නිතරම ඔවුන් සමග සහයෝගිතාවයෙන් කටයුතු කරන්න.
- ඔබ ළමයාට,
    - ඔහු ප්‍රශ්නයකට මුහුණ දී නොමැති බව
    - ඔබ ඔහු ආරක්ෂා කරන බව
    - ළමයා මෙම සිද්ධිය පිළිබඳව හෙළිදරව් කිරීමට ඔබව තෝරාගැනීම පිළිබඳව ඔබ සතුටු වන බව
    - මෙය ඔබට පැවසීමෙන් ඔහු සිදුකර ඇත්තේ නිවැරදි ක්‍රියාවක් බව
    - මෙම සිද්ධිය ඔහුට සිදුවීම පිළිබඳව ඔබ කණගාටු වන බව
    - ඔහුට නැවතත් එවැනි සිද්ධියකට මුහුණ දීමට ඔබ ඉඩ නොතබන බව
    - මෙම ප්‍රශ්නය විසඳීමට හැකි අය පිළිබඳව ඔබ දන්නා බව ඇඟවීම.

- මීළඟට කුමක් සිදුවේද යන්න ළමයාට ප්‍රකාශ කිරීම තුළින් ඔහු තුළ ඔබ පිළිබඳව ඇති විශ්වාසනීයත්වය වර්ධනය කර ගන්න.

- තමන්ට සිදුවූ අපයෝජනයක් සම්බන්ධයෙන් හෙළි කරන ළමයෙකු ඊළඟට සිදුවන්නේ කුමක්ද යන්න හා තමන් ගැන අනෙක් අය සිතන්නේ කුමක්ද යන්න පිළිබඳව දැඩි උනන්දුවක් දක්වයි. කෙසේ වුවද සිදුවිය හැකි හා නොහැකි දේ පිළිබඳව ඔවුනට පොරොන්දු දීමෙන් වළකින්න.

- අපයෝජනයක් හෝ නොසලකා හැරීමක් සම්බන්ධයෙන් හඟ වෙන ළමයා විසින් හෙළිදරව් කළ කරුණු ඔහු ඉදිරිපත් කළ ආකාරයටම (හැකිනම් ඒ වචනයෙන්ම) සටහන් තබා ගන්න. ඔහු විසින් සිද්ධිය සම්බන්ධව කරන ලද රූප සටහන් සහ වෙනත් සටහන් ආරක්ෂිතව තබා ගන්න.

අපයෝජනයක් පිළිබඳව පරීක්ෂණයකදී සලකා බැලිය යුතු කරුණු

ළමා ආරක්ෂණය හා ප්‍රවර්ධනය සම්බන්ධයෙන් හෝ අපරාධ පරීක්ෂණ සම්බන්ධයෙන් පිළිවෙලින් ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරියා/ සහ පොලිස් නිලධාරියාට ළමයාට සම්මුඛ පරීක්ෂණයකට ලක් කිරීමට නීතියෙන් බලය ඇත.

ළමයාට සෙනෙහසින් යුක්තව සැලකීමට මූලිකත්වය දිය යුතුය. සිද්ධිය සිදුවී හැකි පමණ ඉක්මනින් පරීක්ෂණය සිදුවිය යුතු අතර එහි වාර ගණන සහ ඒයට ගතකරන කාලය හැකි තාක් අවම විය යුතුය.

ඉතා ලාබාල ළමයින් හෝ ආබාධිත ළමයින් සම්බන්ධයෙන් සිදුකරන පරීක්ෂණයන් හිදී ඔවුන් සමග කරුණු හුවමාරු කර ගැනීමට විශේෂිත තාක්ෂණික ක්‍රම භාවිතා කිරීමට සිදුවිය හැකිය. මෙහිදී එම ක්ෂේත්‍රයේ ප්‍රවීණයෙකුගේ සේවය ලබා ගැනීමට පරීක්ෂණය මෙහෙයවන්නා කටයුතු කළ යුතුය. විශේෂයෙන්ම මෙවැන්නක් සඳහා ළමයා කැමැත්තක් දක්වන ඔහුට ආරක්ෂාව ලැබේ යැයි හැඟෙන ස්ථානයක් තෝරා ගත යුතුය. ළමයා ශාරීරික ආබාධයකින් පෙළේ නම් ඔහුට අවශ්‍ය පහසුකම් සහිත ස්ථානයක් විය යුතුය. පොලිස් ස්ථානයක් වැනි ස්ථානයකදී මෙය සිදුකරයි නම් අදාල පරීක්ෂණය සිදුකරන කාමරය ළමයාට ප්‍රිය උපදවන ආකාරයට සකසා තිබිය යුතුය.

# ළමයින්ට එරෙහිව සිදුවන වැරදි සම්බන්ධයෙන් සහන පැතීම

## ළමයින්ට එරෙහිව සිදුවන වැරදි සම්බන්ධයෙන් සහන පැතිය හැකි ස්ථාන

- ජාතික ළමා ආරක්ෂක අධිකාරිය,
  අංක 330,
  තලවතුගොඩ පාර,
  මාදිවෙල; කෝට්ටේ
  දුරකථනය 2779196,
  2778911-15

- පොලිස් කාන්තා හා ළමා කොට්ඨාසය,
  අංක 25, වයිට් ප්ලේස් ගොඩනැගිල්ල,
  සර් බාරොන් ජයතිලක මාවත,
  කොළඹ 01. දුරකථනය 2444444

- ළමා සංවර්ධන සහ කාන්තා
  අභිවෘද්ධි අමාත්‍යාංශය,
  අංක 177, නාවල පාර,
  නාරාහේන්පිට, කොළඹ 05.
  දුරකථනය : 011 - 2505584
  ෆැක්ස් : 011 - 2506730

- පරිවාස හා ළමා රක්ෂක
  සේවා දෙපාර්තමේන්තුව,
  අංක 150 ඒ,
  එල්.එච්.පී. ගොඩනැගිල්ල,
  නාවල පාර, නුගේගොඩ,
  දුරකථනය : 011 - 2853596
  ෆැක්ස් : 011 - 2852393

- කාන්තා හා ළමා කටයුතු අංශය,
  කම්කරු දෙපාර්තමේන්තුව,
  කම්කරු මහ ලේකම් කාර්යාලය,
  නාරාහේන්පිට,කොළඹ 05.
  දුරකථනය : 011 - 2587315

- ළමා ලේකම් කාර්යාලය,
  අංක 177, නාවලපාර,
  නාරාහේන්පිට, කොළඹ 05.
  දුරකථනය : 011- 2368956

- සමාජ සුභ සාධන දෙපාර්තමේන්තුව,
  සමාජ සේවය, පරිවාස හා
  ළමා රක්ෂණ සේවය - උතුරු
  නැගෙනහිර පළාත,
  ප්‍රධාන වීදිය, ත්‍රිකුණාමලය,
  දුරකථනය : 026 2223085,
  2222875
  ෆැක්ස් : 026 - 2221040

- පරිවාස හා ළමා රක්ෂක සේවා
  දෙපාර්තමේන්තුව - සබරගමුව පළාත,
  නවනගරය, රත්නපුර.
  දුරකථනය : 045 - 2231222

- පරිවාස හා ළමා රක්ෂක සේවා
  දෙපාර්තමේන්තුව - මධ්‍යම පළාත,
  හේමමාලි මාවත,
  මහනුවර.
  දුරකථනය : 081 - 2223528

- පරිවාස හා ළමා රක්ෂක සේවා
  දෙපාර්තමේන්තුව - වයඹ පළාත,
  අංක 02, දඹුල්ල පාර, කුරුණෑගල,
  දුරකථනය : 037 - 2224796,
  0374 - 690980
  ෆැක්ස් : 0374 - 690980

- පරිවාස හා ළමා රක්ෂක සේවා
  දෙපාර්තමේන්තුව - උතුරුමැද පළාත,
  ජේ බී රත්නායක මාවත,
  අනුරාධපුර.
  දුරකථනය : 025 - 2222570

- පරිවාස හා ළමා රක්ෂක සේවා
  දෙපාර්තමේන්තුව - ඌව පළාත,
  කැප්පෙටිපොළ මාවත, බදුල්ල.
  දුරකථනය : 091 - 2234156

- පරිවාස හා ළමා රක්ෂක
  සේවා දෙපාර්තමේන්තුව - දකුණු පළාත.
  කිතුලම්පිටිය, ගාල්ල.
  දුරකථනය : 091 - 2234156

- පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව - බස්නාහිර පළාත,
  අංක 204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
  බත්තරමුල්ල.
  දුරකථනය : 011 - 4413372
  ෆැක්ස් : 011 - 4413371.

මීට අමතරව පරිවාස හා ළමා රක්ෂණ සේවා දෙපාර්තමේන්තුවේ දිවයින පුරා ක්‍රියාත්මක පරිවාස කාර්යාල වලට සහ කම්කරු දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් කම්කරු කාර්යාල වලට සහ උප කම්කරු කාර්යාල වලට ළමයින්ට එරෙහිව සිදුවන වැරදි සම්බන්ධයෙන් පැමිණිලි කල හැකිය.

ළමයකුගේ මූලික අයිතිවාසිකමක් උල්ලංඝනය වූ විට ගත හැකි පියවර

මූලික අයිතිවාසිකමක් උල්ලංඝනයකදී මෙන්ම උල්ලංඝනය වීමට ආසන්න අවස්ථාවකදීද ඒ සම්බන්ධයෙන් නඩු පැවරීමේ හැකියාව තිබේ.

මූලික අයිතිවාසිකම් පෙත්සම් ඉදිරිපත් කළ හැකි ආයතන

- ශ්‍රේෂ්ඨාධිකරණය
- මානව හිමිකම් කොමිෂන් සභාව
- ඔම්බුඩ්ස්මන්

ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් කඩවීම් සම්බන්ධයෙන් නඩු පවරන්නේ නම් මාසයක් ඇතුළත කළ යුතුය.

කෙසේ වුවද, මානව හිමිකම් කොමිසමේ ඒ සම්බන්ධයෙන් පැමිණිල්ලක් කර ඇති විටක, මෙම මාසයක සීමාව බලනොපාන අතර මානව හිමිකම් කොමිසම විසින් දෙන තීරණයකට එකඟ නොවේ නම්, එම තීරණයේ දින සිට මාසයක කාලසීමාවක් ඇතුළත ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු පැවරිය හැක. මානව හිමිකම් කොමිෂන් සභාවට සිද්ධිය සිදුවී වසරක් ඇතුළත පැමිණිලි කළ යුතුය. නමුත් ළමයෙකු සම්බන්ධ ප්‍රශ්නයකදී, නම් හැකි ඉක්මනින් පැමිණිලි කිරීම සුදුසුය.

## මූලික අයිතිවාසිකම් පිළිබඳ නීති සහය ලබා ගත හැකි ආයතන

- මානව හිමිකම් කේන්ද්‍රය
  ශ්‍රී ලංකා නීතිවේදීන්ගේ සංගමය
  අංක 153, මිහිඳු මාවත,
  අළුත්කඩේ කොළඹ 12.
  දුරකථනය 2447134
  2331697/2387477

- මානව හිමිකම් සංවර්ධනය පිළිබඳ
  නීතිවේදීන්ගේ සංවිධානය
  අංක 233/1, කෝට්ටේ පාර,
  බොරැල්ල, කොළඹ 08.
  දුරකථනය 2686180 2687665

- සර්වෝදය නීතිසේවා සංසදය
  අංක 98,
  රාවතාවත්ත පාර,
  මොරටුව.
  දුරකථනය 26546490

- නීති ආධාර කොමිසම
  මහාධිකරණ සංකීර්ණය
  අළුත්කඩේ
  කොළඹ 12
  දුරකථනය 2433618

## නීති ආධාර කොමිසමේ ශාඛා

| | |
|---|---|
| මාතර | - (041) 222 4821 |
| කුරුණෑගල | - (035) 223 1790 |
| මහනුවර | - (081) 444 4614 |
| අම්පාර | - (063) 222 3496 |
| මොණරාගල | - (055) 227 6891 |
| කෑගල්ල | - (035) 223 1790 |
| නුවරඑළිය | - (052) 223 5260 |
| අනුරාධපුරය | - (025) 222 4465 |
| හම්බන්තොට | - (047) 222 1092 |
| මීගමුව | - (031) 223 1636 |
| මාතලේ | - (053) 223 0419 |

ලිංගික අපයෝජනයට හෝ කාර අමානුෂික වදහිංසාවකට ගොදුරු වූ ළමයෙකු ඔබට හමුවූ විට

- ❖ හැකි ඉක්මනින් වෛද්‍ය පරීක්ෂණයක් සඳහා අධිකරණ වෛද්‍යවරයෙකු හෝ ඕනෑම වෛද්‍යවරයෙකු වෙත හෝ රෝහලකට ඇතුලත් කර වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරන්න.
- ❖ ප්‍රදේශයේ වෛද්‍යවරයෙකු නොමැති විට හෝ වෙනත් අපහසුතාවයක් ඇතිවිට කොළඹ අධිකරණ වෛද්‍ය අංශයට හෝ විශ්ව විද්‍යාලයක අධිකරණ වෛද්‍ය අංශයට පෙන්වන්න.
- ❖ වෛද්‍ය පරීක්ෂණයට භාජනය කිරීමේදී ළමයා වයස අවුරුදු 16ට අඩු නම් භාරකරුගෙන් අවසර ගත යුතුය

- අධිකරණ වෛද්‍ය අංශය,
  වෛද්‍ය පීඨය,
  කිංසි පාර,
  කොළඹ 08.
  දුරකථන අංක 2694016

- අධිකරණ වෛද්‍ය අංශය.
  වෛද්‍ය පීඨය.
  රුහුණ විශ්ව විද්‍යාලය.
  අංක 70, ගාල්ල.
  දුරකථන 091 2234416

- අධිකරණ වෛද්‍ය අංශය,
  වෛද්‍යපීඨය,
  පේරාදෙණිය විශ්ව විද්‍යාලය,
  පේරාදෙණිය.
  දුරකථන (081) 223 88083

- අධිකරණ වෛද්‍ය අංශය,
  වෛද්‍ය පීඨය,
  කැළණිය විශ්ව විද්‍යාලය,
  රාගම.
  දුරකථන 2958039/2956152

භාරකරු කැමැත්ත දීම ප්‍රතික්ෂේප කරන්නේ නම් වෛද්‍ය පරීක්ෂණයට පෙර මහේස්ත්‍රාත්වරයෙකුගෙන් නියෝගයක් ලබා ගත යුතුවේ.

## මත් ද්‍රව්‍ය වලට යොමුවූ ළමයින්ව පුනරුත්ථාපනය සඳහා යොමු කළ හැකි ස්ථාන

- ජාතික අන්තරායදායක ඖෂධ පාලක මණ්ඩලය,
  අංක 383 කෝට්ටේ පාර, රාජගිරිය.
  දුරකථන 011 2868794-6
  ෆැක්ස් 011 2868791

- ශ්‍රී ලංකා මත්ද්‍රව්‍ය විරෝධී සංගමය,
  අංක 121, කින්සි පාර,
  කොළඹ 08.
  දුරකථන 011 2688311

- සුමිත්‍රයෝ,
  මැල් මැදුර,
  අංක 60 හෝර්ටන් පෙදෙස,
  කොළඹ 07.
  දුරකථන 011 2692909

ළමයෙකු නීති විරෝධී ලෙස රඳවාගෙන ඇති අවස්ථාවක :
යම් ළමයෙකු නීති විරෝධී ලෙස සිරභාරයට ගෙන නීති විරෝධී ලෙස පොලිසියෙන්/හමුදාවෙන් /රිමාන්ඩ් බන්ධනාගාරයේ රඳවා ගෙන සිටී නම් එම නිලධාරීන්ට විරුද්ධව හබයස් කෝපුස් අයදුම්පතක් අභියාචනාධිකරණයේ පැවරීමට පීඩාවට පත්වූ ළමයාගේ නෑදෑයින්ට හෝ හිතවතුන්ට හැකියාව තිබේ.

බාලවයස්කාර ළමයෙකු නීති විරෝධී ලෙස සේවයේ යොදවා ඇති විට පැමිණිලි කළ හැකි ස්ථාන-

- ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
- පොලිස් කාන්තා හා ළමා කොට්ඨාශය හෝ දිවයිනේ ඕනෑම පොලිස් ස්ථානක කාන්තා හා ළමා කාර්යාංශ ඒකකයන්
- පරිවාස හා ළමා රක්ෂණ සේවා දෙපාර්තමේන්තුවේ දිවයින පුරා ක්‍රියාත්මක පරිවාස කාර්යාල
- කම්කරු දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් කම්කරු කාර්යාල වලට සහ උප කම්කරු කාර්යාල

## මත් ද්‍රව්‍ය වලට යොමුවූ ළමයින්ව පුනරුත්ථාපනය සඳහා යොමු කළ හැකි ස්ථාන

- ජාතික අන්තරායදායක ඖෂධ
  පාලක මණ්ඩලය,
  අංක 383 කෝට්ටේ පාර, රාජගිරිය.
  දුරකථන 011 2868794-6
  ෆැක්ස් 011 2868791

- ශ්‍රී ලංකා මත්ද්‍රව්‍ය විරෝධී සංගමය,
  අංක 121, කින්සි පාර,
  කොළඹ 08.
  දුරකථන 011 2683311

- සුමිත්‍රයෝ,
  මැල් මැදුර,
  අංක 60 හෝර්ටන් පෙදෙස,
  කොළඹ 07.
  දුරකථන 011 2692909

ළමයෙකු නීති විරෝධී ලෙස රඳවාගෙන ඇති අවස්ථාවක :
යම් ළමයෙකු නීති විරෝධී ලෙස සිරභාරයට ගෙන නීති විරෝධී ලෙස පොලිසියෙන්/හමුදාවෙන් /රිමාන්ඩ් බන්ධනාගාරයේ රඳවා ගෙන සිටී නම් එම නිලධාරීන්ට විරුද්ධව හබයස් කෝපුස් අයදුම්පතක් අභියාචනාධිකරණයේ පැවරීමට පීඩාවට පත්වූ ළමයාගේ නෑදෑයින්ට හෝ හිතහිතවතුන්ට හැකියාව තිබේ.

බාලවයස්කාර ළමයෙකු නීති විරෝධී ලෙස සේවයේ යොදවා ඇති විට පැමිණිලි කළ හැකි ස්ථාන-

- ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
- පොලිස් කාන්තා හා ළමා කොට්ඨාශය හෝ දිවයිනේ ඕනෑම පොලිස් ස්ථානයක කාන්තා හා ළමා කාර්යාංශ ඒකකයන්
- පරිවාස හා ළමා රක්ෂණ සේවා දෙපාර්තමේන්තුවේ දිවයින පුරා ක්‍රියාත්මක පරිවාස කාර්යාල
- කම්කරු දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් කම්කරු කාර්යාල වලට සහ උප කම්කරු කාර්යාල

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පිළිබඳ හැඳින්වීමක්

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ස්වාධීන කොමිෂන් සභාවකි.. රට තුළ මානව හිමිකම් ප්‍රවර්ධනය සහ ආරක්ෂා කිරීම උදෙසා එම කොමිෂම පිහිටුවා තිබේ. එයට අයත් බලතල සහ කාර්යයන් 1996 අංක 21 දරණ මානව හිමිකම් කොමිෂන් සභා පනත මගින් දක්වා ඇත. කොමිෂන් සභාවට සාමාජිකයන් පත් කිරීම 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 17 වන සංශෝධනය යටතේ දක්වා තිබේ.

බලතල

ස්වකීය කර්තව්‍යයන් ඉටු කරලීම සඳහා පහත සඳහන් දෑ ඇතුළත් පුළුල් බලතල මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පවරා ඇත :

- මූලික අයිතිවාසිකම් කඩවීම පිළිබඳව විමර්ශනය සහ විභාග කිරීම.
- අධිකරණයේ අවසර ඇතිව, අධිකරණ ඉදිරියේ ඇති නඩු විභාග වලට මැදිහත් වීම.
- රඳවා ඇති ස්ථාන නිරන්තරව පරීක්ෂා කිරීම මගින් රැඳවියන්ගේ සුභසාධනය නියාමනය කිරීම.
- මානව හිමිකම් ගැටළු පිළිබඳ පර්යේෂණ කිරීම සහ මානව හිමිකම් පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීම.
- සාක්ෂි දීම සඳහා කොමිෂම ඉදිරියට පුද්ගලයන් කැඳවීම සහ සාක්ෂිකරුවන් විභාග කිරීම.

(1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 11 වන වගන්තිය)

කාර්යයන්

මානව හිමිකම් කඩ කිරීම පිළිබඳ විමර්ශනයට අමතරව බොහෝ කාර්යයන් කොමිෂන් සභාව සතුව තිබේ :

- සියලුම රාජ්‍ය ක්‍රියා පටිපාටීන් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති මූලික අයිතිවාසිකම් හා අනුකූල බව සහතික කිරීම.
- නීති සම්පාදනයේදී හා පරිපාලනමය මග පෙන්වීම හා ක්‍රියා පටිපාටීන් සැකසීමේදී ඒවා මූලික අයිතිවාසිකම් වලට අනුකූලව සැකසීමට රජයට උපදෙස් දීම හා සහාය වීම.

- දේශීය නීතිය හා පරිපාලනමය ව්‍යවහාරයන් ජාත්‍යන්තර මානව හිමිකම් පිළිබඳ යුතුකම් සමග අනුකූල වන පරිදි පවත්වා ගැනීම සම්බන්ධව රජයට නිර්දේශයන් ඉදිරිපත් කිරීම.
- ජාත්‍යන්තර මානව හිමිකම් සම්මුතීන් නෛතිකව පිළිගැනීම පිළිබඳව රජයට උපදෙස් දීම. .
- රට තුළ මානව හිමිකම් පිළිබඳ දැනුවත් බව ප්‍රවර්ධනය කිරීම. (1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 10 වන වගන්තිය)

## ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සමග සම්බන්ධ විය හැකි ආකාරය


ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

ප්‍රධාන කාර්යාලය

අංක 36 කිංසි පාර, කොළඹ 08

සෘජු ඇමතුම් :- 94 11 2689064

දුරකථනය :- 94 11 2694925 /2685980/ 2685339/ 2685981

ෆැක්ස් :- 94 11 2694924 2696470

විද්‍යුත් තැපැල :- sechrc@sltnet.lk

වෙබ් අඩවිය :- www.hrcsl.org

# ප්‍රාදේශීය කාර්යාල

| ප්‍රාදේශීය කාර්යාල | ලිපිනය | දුරකථන අංකය | විද්‍යුත් තැපැල |
|---|---|---|---|
| මහනුවර | 839/2ඒ පේරාදෙණිය පාර, මහනුවර. | 081 2222855 | hrckandy@sltnet.lk |
| මාතර | 15 කාලිදාස පාර, මාතර | 041 2223307 2226533 | hrcmatara@sltnet.lk |
| මඩකලපුව | 24 සින්න උප්පෝඩි පාර, මඩකලපුව | 065 224420 | hrch@sltnet.lk. |
| අනුරාධපුරය | ඔමාහර නිවස 63, නිමල් මාවත අනුරාධපුරය | 025 2234801 | hrcranu@sltnet.lk |
| ත්‍රිකුණාමලය | 97 කස්ටම් පාර, ත්‍රිකුණාමලය. | 026 2222607 | hrct@sltnet.lk |
| වවුනියාව | 129 කන්දසාමි කෝවිල් පාර, වවුනියාව | 024 2221060 | hrcv@sltnet.lk |
| බදුල්ල | 9/2 ඒ සේනානායක උද්‍යාන මාවත,බදුල්ල | 055 2229634 | badullahrc@sltnet.lk |
| අම්පාර | ඩී 768/1 පණ්ඩුකාභය මාවත, අම්පාර | 063 2222340 | hrcampara@sltnet.lk |
| කල්මුණේ | 81 සිවංගි පාර, මහල්වෙල කල්මුණේ | 067 2229728 | hrcka@sltnet.lk |
| යාපනය | නො: 1 3 වෙනි පරස්විදිය, යාපනය | 021 2222021 | rvpk@sltnet.lk |
| ශාඛා | | | |
| පුත්තලම | කොළඹ පාර, පුත්තලම. | 032 22652086 | hrcpidp@sltnet.lk |
| මන්නාරම | 952/1 නිව් ස්ට්‍රීට්, උප්පුකුලම. | 023 2232341 | hrcmidp@sltnet.lk |

**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**
No. 36, Kynsey Road, Colombo 08.
Tel : 2694925, 2673806, 2685980, 2685981, 2685339
Fax : 2694924 E-mail : serchrc@sltnet.lk
web : www.hrcsl.org